Department of Education,Sabaragamuwa Province/ Weekly School

**තොරතුරු පත්‍රිකාව**

# රඟන චරිත හඳුනාගනිමු.



නාට්‍ය පෙළක් රංගයක් බවට පත් කිරීමේ දී ඒ සඳහා චරිත රාශියක් යොදා ගනී. චරිතයක් ලෙස හඳුන්වන්නේ එම නාට්‍යයේ නියෝජිත පුද්ගලයන් ය. එම පුද්ගලයින් අප හඳුන්වන්නේ නළුවා හෝ නිළිය ලෙස ය. චරිත මඟින් නාට්‍යයේ පෙළ මඟින් දක්වා ඇති කිසියම් අවස්ථාවක් හෝ සිදුවීමක් වේදිකාව මත අනුකරණාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමයි.

අපට සමාජයේ ජීවත් වීමේ දී විවිධ චරිත හමු වේ. එවැනි චරිත තුළ තිබෙන පොදු ලක්ෂණ මෙන්ම චර්යා රටා ද හඳුනාගත යුතු ය. එය කිරීමට නම් නිරීක්ෂණය අවශ්‍ය වේ. නිරීක්ෂණය මඟින් ලබා ගන්නා අවබෝධය තුළින් ඒවායේ මූලික ස්වභාවය මත පදනම් ව නාට්‍යයක දී චරිත ප්‍රතිනිර්මාණය කළ යුතු ය.

නාට්‍යයක චරිත සැම විටම මිනිස් චරිත නොවේ. නාට්‍යය සඳහා ඇතැම් විට සත්ත්ව චරිත ද යොදා ගැනේ. නරිබෑණා නාට්‍යයේ නරියා, මාෂා සහ වලසා නාට්‍යයේ වලහා, සිංහබාහු නාට්‍යයේ සිංහයා ඒ සඳහා උදාහරණ වේ. මෙවැනි චරිතයක් රංගනයේ දී එම සතුන්ගේ හැසිරීම් ස්වභාවය, ගමන් විලාශය, ගති පැවතුම්, ආහාර රටා ආදී සියලු හැසිරීම් පිළිබඳ ව මනා වැටහීමක් ලබා ගැනීම මඟින් එම චරිතයට ප්‍රවිශ්ට වී සාර්ථක රංගනයක් සිදු කිරීමට අවකාශය ලැබේ.

උදා:- සොලමන් ෆොන්සේකා මහතා නරියාගේ චරිතය නිරූපණය කිරීමේ දී සත්තු වත්තට ගොස් නරි ගතිපැවතුම් නිරීක්ෂණය කිරීම.





## පැවරුම

1. ඔබ දකිනා සමාජයේ චරිත 05ක් නම් කරන්න.
2. ඔවුන්ගේ රූප ඇඳ දක්වන්න.
3. පුවත්පත්වලින් නාට්‍යයට සම්බන්ධ චරිත 05ක් කපා අලවන්න.
4. අලවන ලද සහ අඳින ලද චරිතවල ලක්ෂණ වෙන් වෙන් වශයෙන් වගුගත කර විස්තර කරන්න.